චක්‍රලේඛ අංක : 02/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව(බ:ප:),

අංක 109 , හතර වන මහල,

මහ වීදිය,

බත්තරමුල්ල.

2017. 03 15

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,

දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ

අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>ඉන්ධන පිරවුම්හල් පොම්පකරුවන් සඳහා දිරි දීමනාවක් ගෙවීම.</u>**

විවිධ සේවා සමුපකාර සමිති විසින් පවත්වා ගෙන යනු ලබන ඉන්ධන පිරවුම්හලක මාසික දළ ලාභය රු.100,000.00 ඉක්මවන්නේ නම්, පහත සඳහන් කොන්දේසි යටතේ එම ඉන්ධන පිරවුම්හල් පොම්පකරුවන් සඳහා රු.3,000.00 මාසික දිරි දීමනාවක් ද, අනතුරුව මාසික දළ ලාභය රු.250,000.00 ඉක්මවන්නේ නම් තවත් රු.1,000.00ක දිරි දීමනාවක් ගෙවීම ද කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව කොමිෂන් සභා නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

I. මාසිකව අවම වශයෙන් දින 21ක් සේවයට වාර්තා කර තිබිය යුතු අතර, එක් දිනයක් තුළ අවම වශයෙන් පැය 08ක් සේවය කර තිබීම ඉහත දීමනාව ලබා ගැනීම සඳහා අනිවාර්ය වේ.

II. මෙම දීමනාව ගෙවීමේ දී අර්ධ සේවා මුර අදාල කර නොගත යුතුය.

III. මෙම දිරි දීමනාව රු.4,000.00 නොඉක්මවිය යුතුය.

IV. 2017-04-01 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වේ.

02. 12/2005 අංක දරණ සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

එස්. ඒ. එල්. රංගනී,

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධානලේකම්, බස්නාහිර පළාත.

II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.

III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.

IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)

V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.

VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.

VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.

VIII. සියළුම වෘත්තීය සමිති සංගම්